එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන ලේකම් අකිල විරාජ් කාරියවසම් විසින් පාර්ලිමේන්තු මැතිවරණය අත්හිටුවන ලෙසින් ඉල්ලා සිටිමින් ගොනු කර තිබූ පෙත්සම සම්බන්ධයෙන් මව්බිම, ලංකාදීප සහ දිනමිණ පුවත්පත් ඉදිරිපත් කොට තිබූ පුවත් වාර්තාවන් අපගේ නිරීක්ෂණයට ලක් විණි.

"එජාපය ගොනු කළ පෙත්සම එම පක්ෂයෙන්ම ඉල්ලා අස්කරගනී" යන සිරස්තලයෙන් යුතු ලංකාදීප පුවත් වාර්තාවක්ද, "අකිල, මූලික අයිතිවාසිකම් පෙත්සම ඉවත් කරගනී" යන සිරස්තලයෙන් යුතු දිනමිණ පුවත් වාර්තාවක්ද විණි. දිනමිණ හා ලංකාදීප පුවත් වල සඳහන් වූයේ පෙත්සම්කාර පාර්ශවයෙන් එම පෙත්සම ඉල්ලා අස්කර ගැනීමට කළ ඉල්ලීම පිළිගත් ශ්‍රේෂ්ඨාධිකරණය එය නිෂ්ප්‍රභා කළ බවයි. ජනාධිපති නීතීඥ සහ රජයේ නීතිපති වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් විසින් ඉදිරිපත් කළ පෙන්වා දීම් අනුව පෙත්සම්කාර පාර්ශවය එම පෙත්සම ඉල්ලා අස්කරගැනීමට අවසර ඉල්ලා සිටි බව දිනමිණ පුවතේ වැඩිදුරටත් සඳහන් විණි.

කෙසේ නමුත් "මහ ඡන්දෙට එරෙහි අකිලගේ පෙත්සම ඉවතට" යන සිරස්තලයෙන් යුතුව පළ වූ මව්බිම පුවත් වාර්තාවේ දැක්වී තිබුණේ, මෙම පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චය මණ්ඩලයක් මගින් ඊයේ නිෂ්ප්‍රභා කෙරුණු බවයි. එසේම එය නිෂ්ප්‍රභා කෙරුණේ, ජනාධිපති නීතීඥයෙකු සහ රජයේ නීතිපති වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් විසින් ඉදිරිපත් කළ මූලික විරෝධතාවය පිළිගනිමින් බවද එහි තවදුරටත් දැක්වී තිබිණි.

මෙසේ බැලූ විට මෙම පෙත්සම සම්බන්ධව දිනමිණ සහ ලංකාදීප පුවත් වාර්තාවන් ඉදිරිපත් කරනා කරුණු වලට හාත්පසින්ම වෙනස් කරුණු පෙළගැස්වීමක් මව්බිම පුවත මගින් ඉදිරිපත් කරයි. පාඨකයින් ලෙසට අප ඇසිය යුතු පැනය වන්නේ මෙහිදී නිවැරදි පුවත ඉදිරිපත් කරන්නේ කවුරුන්ද යන්නයි. එහිදී පාඨකයා නොමග යවනා සුළු ආකාරයෙන් කරුණු ඉදිරිපත් කොට ඇති කවර පුවත්පත වුවත් මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් සිදුකර තිබෙනා බවද මෙසේම පැවසිය යුතු වේ.

**#MediaEthics #lka #SinhalaPress #Dinamina #Lankadeepa #Mawbima**